# තෙරසමො පාඨො

# නිග්‍රොධසාමණෙරො

එවං ගච්ඡන්තෙ කාලෙ එකදිවසං සීහපඤ්ජරෙ ඨිතො අද්දස, නිග්‍රොධසාමණෙරං රාජඞ්ගණෙ ගච්ඡන්තං දන්තං ගුත්තං සන්තින්ද්‍රියං ඉරියාපථසම්පන්නං, කො පනායං නිග්‍රොධො නාම, බින්දුසාරරඤ්ඤො ජෙට්ඨපුත්තස්ස සුමනරාජකුමාරස්ස පුත්තො. 'තත්‍රායං ආනුපුබ්බි, කථා; බින්දුසාරරඤ්ඤො කිර දුබ්බලකාලෙයෙව අසොකකුමාරො අත්තනා ලද්ධං උජ්ජෙනිරජ්ජං පහාය ආගන්ත්වා සබ්බං නගරං අත්තනො හත්ථගතං කත්වා සුමනරාජකුමාරං අග්ගහෙසි. තං දිවසමෙව සුමනස්ස රාජකුමාරස්ස සුමනා නාම දෙවී පරිපුණ්ණගබ්භා අහොසි. සා අඤ්ඤාතකවෙසෙන නික්ඛමිත්වා අවිදූරෙ අඤ්ඤතරං චණ්ඩාලගාමං සන්ධාය ගච්ඡති. ජෙට්ඨකචණ්ඩාලස්ස ගෙහතො අවිදූරෙ එකස්මිං නිග්‍රොධරුක්ඛෙ අධිවත්ථාය දෙවතාය ඉතො එහි සුමනෙ'ති වදන්තියා සද්දං සුත්වා තස්සා සමීපං ගතා. දෙවතා අත්තනො ආනුභාවෙන එකං සාලං නිම්මිණිත්වා එත්ථ වසාහීති පාදාසි. සා තං සාලං පාවිසි. ගතදිවසෙයෙව පුත්තං විජායි. සා තස්ස නිග්‍රොධදෙවතාය පරිග්ගහිතත්තා නිග්‍රොධොත්වෙව නාමං අකාසි. ජෙට්ඨකචණ්ඩාලො දිට්ඨදිවසතොප්පභූති තං අත්තනො සාමිධීතරං විය මඤ්ඤමානො නිබද්ධං වට්ටං පට්ඨපෙසි. රාජධීතා තත්ථ සත්තවස්සානි වසි. නිග්‍රොධකුමාරො'පි සත්තවස්සිකො ජාතො. තදා මහාවරුණත්ථෙරො නාම එකො අරහා දාරකස්ස හෙතුසම්පදං දිස්වා විහරමානො සත්තවස්සිකො'දානි දාරකො, කාලො, නං පබ්බාජෙතුන්ති චින්තෙත්වා රාජධීතාය ආරොචාපෙත්වා නිග්‍රොධකුමාරං පබ්බාජෙසි. කුමාරො ඛුරග්ගෙයෙව අරහත්තං පාපුණි.

(ථූපවංස)

## පදමාලාව

| | | | |
|---|---|---|---|
| **සීහපඤ්ජරෙ** | (ස) | - | සීමැදුරෙහි |
| **අද්දස** | (ක්‍රි) | - | දුටුවේය |
| **රාජඞ්ගණෙ** | (ස) | - | රජ මිදුලෙහි |
| **දන්තං** | (කි) | - | දමුණු |
| **ගුත්තං** | (කි) | - | (ඉඳුරන්) රැකුණු |
| **සන්තින්ද්‍රියං** | (ස) | - | සන්සුන් ඉඳුරන් ඇති |
| **ඉරියාපථසම්පන්නං** | (ස) | - | ඉරියවුවලින් යුතු |
| **ජෙට්ඨපුත්තස්ස** | (ස) | - | දෙටුපුතුගේ |
| **දුබ්බලකාලෙයෙව** | (ස) | - | දුර්වල කාලයේදීම |
| **ලද්ධං** | (කි) | - | ලබන ලද |
| **හත්ථගතං කත්වා** | (පූ.ක්‍රි) | - | අත්පත් කොට |
| **පරිපුණ්ණගබ්භා** | (ස) | - | පිරිපුන් ගැබ් ඇත්තී |
| **අඤ්ඤාතකවෙසෙන** | (ස) | - | නොදන්නා වේශයෙන් (වෙස්වළාගෙන) |

| | | | |
|---|---|---|---|
| **අඤ්ඤතරං** | (ස.නා) | - | එක්තරා |
| **ජෙට්ඨක** | (ත) | - | ජ්‍යෙෂ්ඨ |
| **නිග්‍රොධරුක්ඛ** | (ස) | - | නුග ගසක |
| **අධිවත්ථාය** | (කි) | - | අධිගෘහිත |
| **වදන්තියා** | (කි) | - | කියන්නා වූ |
| **ගතදිවසෙ** | (ස) | - | ගිය දවසෙහිම |
| **පරිග්ගහිතත්තා** | (ත) | - | ඊකගත් බැවින් |
| **දිට්ඨදිවසතොපපභුති** | (සං) | - | දක්නා ලද දිනයේ පටන් |
| **සාමිධීතරං විය** | (ස) | - | සාමි දියණිය මෙන් |
| **මඤ්ඤමානො** | (කි) | - | සිතන්නේ |
| **නිබද්ධං** | (නි) | - | නිතර |
| **වට්ටං** | (නා) | - | වැටුප් |
| **පට්ඨපෙසි** | (ක්‍රි) | - | පිහිටුවීය |
| **සත්තවස්සිකො** | (ස) | - | සත් හැවිරිදි |
| **හෙතුසම්පදං** | (ස) | - | පුණ්‍ය මහිමය |
| **ආරොචාපෙත්වා** | (පූ.ක්‍රි.) | - | දන්වවා |
| **ඛුරග්ගෙයෙව** | (ස) | - | දැළිපිහියෙන් හිස මුඩුකොට අවසන් වෙද්දීම |
| **අරහත්තං** | (න) | - | රහත්බවට |

**අභ්‍යාස**

1. 'නිග්‍රොධ සාමණෙරො' යන ඡේදය සිංහලට නගන්න.

2. ඡේදය ඇසුරින් පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො පන දන්තො ගුත්තො සන්තින්ද්‍රියො ඉරියාපථසම්පන්නො අහොසි ?
ii. සුමනස්ස රාජකුමාරස්ස කා නාම දෙවී අහොසි ?
iii. කො සුමනාය දෙවියා සාලං නිම්මිණිත්වා අදාසි ?
iv. නිග්‍රොධසාමණෙරස්ස කො නාම ආචරියො අහොසි ?
v. නිග්‍රොධකුමාරො කතිවස්සිකකාලෙ පබ්බජි.

3. සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. නිග්‍රොධ කුමරුගේ මව සහ පියා කවුද?
ii. සුමනා දේවිය වෙස්වළාගෙන යාමට හේතු වූ කරුණ කුමක් ද?
iii. සුමනා දේවිය සැඬොල්ගම කොපමණ කාලයක් විසුවා ද?
iv. 'ඛුරග්ගෙයෙව අරහත්තං පාපුණි' යන්නට විවරණයක් සපයන්න.

## තද්ධිත නාම I

තද්ධිත යනු නාමයකින් පරව ප්‍රත්‍යයක් යෙදී සෑදෙන ද්විතීයික නාමයකි. සමාසයෙන් වන පද සංක්ෂේපයට වඩා තද්ධිතයෙන් පදවල අති සංක්ෂිප්ත බවක් ඇති වේ. භාෂාව විසිතුරුවීම, අර්ථය හරවත් වීම, ව්‍යක්ත වීම, උච්චාරණය පහසු වීම හා එකම පදයක් වීම තද්ධිතයන්හි සුවිශේෂී ප්‍රයෝජනයන් ය.

නාමයකින් පරව විශේෂ අර්ථයක් ගෙන දෙන ප්‍රත්‍යයක් එකතුවීමෙන් සාදාගන්නා නාම තද්ධිත නම් වේ.

**නිදඃ- සූකර +ණික - සූකරික - ඌරන් මරන්නා**

තද්ධිත පද සාධනයේ දී බොහෝවිට පදයේ මුල් ස්වරය වෘද්ධි වේ. වෘද්ධි වනුයේ ප්‍රත්‍යයේ යෙදෙන ණ කාරයේ බලපෑමෙනි. වෘද්ධි කාර්යය සිදුවනුයේ පහත සූත්‍රයට අනුවය. **(ආයුවණ්ණානං චායො වුද්ධි - අකාර ඉවණ්ණුවණ්ණානං ආ එ ඔ වුද්ධියො හොනති)** ඒ අනුව,

| | | | | |
|---|---|---|---|---|
| අ | > ආ වේ - | **සමණ + ණෙර** | **- සාමණෙර** | **(ශ්‍රමණයාගේ පුතා)** |
| **ඉ ඊ** | > **එ වේ -** | **වීණා + ණික** | **- වෙණික** | **(වීණා ශිල්පය දන්නා)** |
| **උ ඌ** | > **ඔ වේ -** | **උපගු + ණව** | **- ඔපගව** | **(උපගුගේ පුත්‍රයා)** |

වෘද්ධිකාර්ය වනුයේ නාමයේ මුලම ස්වරයටයි.

තද්ධිතපද සාධනය බාලාවතාර සූත්‍රානුසාරයෙන් මෙසේය.

**සමණ +ණෙර - ණෙර විධවාදිකො**
**සා මණ +ණෙර - අයුවණ්ණානං චායො වුද්ධි**
**සා මණ් + එර - සරා සරෙ ලොපං**
**සාමණෙර - නයෙ පරං යුතෙත.**

මෙසේ තද්ධිත පද සාධනය වේ.

## තද්ධිත ප්‍රභේද

තද්ධිතය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදේ.

1. **සාමඤ්ඤ තද්ධිතය**
2. **භාව තද්ධිතය**
3. **අව්‍ය තද්ධිතය** වශයෙනි.

නැවත එහි සාමඤ්ඤ තද්ධිතයෙහි ප්‍රභේද 4කි. **අපච්චත්‍ථ තද්ධිතය, අනෙකත්‍ථ තද්ධිතය අත්ථ්‍යත්‍ථ තද්ධිතය, සංඛ්‍යා තද්ධිතය** යනුවෙනි.

ඒ අනුව තද්ධිත නාමවල ප්‍රභේද හයකි.

**අපච්චත්‍ථ තද්ධිතය**
**අනෙකත්‍ථ තද්ධිතය**
**අත්ථ්‍යත්‍ථ තද්ධිතය**
**සංඛ්‍යා තද්ධිතය**
**භාව තද්ධිතය**
**අව්‍යය තද්ධිතය** වශයෙනි.

## අපච්චත්‍ථ තද්ධිත නාම

පුත්‍රාර්ථය ප්‍රකාශ කරන ණ ආදී ප්‍රත්‍යය එක් වී අපච්චත්‍ථ තද්ධිත පද සෑදේ. ණ **(වාණප්පච්චෙ)** ණායන, ණාන, **(ණායන ණානා වච්චාදිතො)** ණෙය්‍ය **(ණෙය්‍යො කත්තිකාදීහි)** ණි, ණික, ඛ, **(අතොණි වා)** ණව **(ණවොපගවාදීහි)** ණෙර **(ණෙර විධවාදිතො)** යන ප්‍රත්‍යය අපත්‍යාර්ථය ප්‍රකාශ කරයි.

i ණ -

ෂට්ඨී විභක්ත්‍යන්ත ශබ්දවලින් පරව පුත්‍රාර්ථය ප්‍රකාශ කිරීමට ණ ප්‍රත්‍යය යෙදේ. **(වාණප්පච්චෙ- ඡට්ඨ්‍යන්තා සද්දා තස්සාපච්චමිච්චස්මිං අත්‍ථෙ ණො වා හොති)**

**වසිට්ඨස්ස අපච්චං = වසිට්ඨ + ණ = වාසිට්ඨ = (වසිට්ඨගේ පුතු)**
**ගොතමස්ස අපච්චං = ගොතම + ණ = ගොතම = (ගොතමගේ පුතු)**
**වසුදෙවස්ස අපච්චං = වසුදෙව + ණ = වාසුදෙව = (වසුදේවගේ පුතු)**

ii. ණායන, ණාන

වච්ච ආදී ගෝත්‍ර ගණ වාචක ශබ්දවලින් පරව ගෝත්‍රාර්ථයෙහි ණායන, ණාන ප්‍රත්‍යය යෙදේ. **(ණායන ණානා වච්ඡාදිතො - වච්ඡාදිතො ගොත්තගණතො ණායන ණානා ච හොති. අපච්චං පපුත්තප්පභුති ගොත්තං)**

**කච්චස්ස අපච්චං = කච්ච + ණායන = කච්චායන = (කච්චගේ පුතු)**
**කච්චස්ස අපච්චං = කච්ච + ණාන = කච්චාන = (කච්චගේ පුතු)**
**වච්ඡස්ස අපච්චං = වච්ඡ + ණායන = වච්ඡායන = (වච්ඡගේ පුතු)**
**වච්ඡස්ස අපච්චං = වච්ඡ + ණාන = වච්ඡාන = (වච්ඡගේ පුතු)**

iii. ණෙය්‍ය

කත්තිකාදී ස්ත්‍රීවාචක නාමයන්ගෙන් පර ව ණෙය්‍ය ප්‍රත්‍යය වේ. **(ණෙය්‍යො කත්තිකාදීහි)**

**විනතාය අපච්චං = විනතා + ණෙය්‍ය = වෙණතෙය්‍ය = (විනතාවගේ පුතු)**
**භගිනියා අපච්චං = භගිනී + ණෙය්‍ය = භාගිණෙය්‍ය = (නැගණියගේ පුතු)**
**රොහිණියා අපච්චං = රොහිණී + ණෙය්‍ය = රොහිණෙය්‍ය = (රෝහිණියගේ පුතු)**

iv. ණි ණික බ - අකාරාන්ත ශබ්දයන්ගෙන් පරව ණි ප්‍රත්‍යය ද ඇතැම්විට ණික ප්‍රත්‍යය ද බ ප්‍රත්‍යය ද වේ. **(අතොණි වා අකාරනතතො අපච්චත්‍ථෙ ණි වා හොති පුන වා සද්දෙන ණිකො අකාරනතා අනකාරනතා ච බො පි.)**

**දක්ඛස්ස අපච්චං = දක්ඛ + ණී = දක්ඛී = (දක්ෂගේ පුතු)**
**සක්‍යපුත්තස්ස අපච්චං = සක්‍යපුත්ත + ණික = සක්‍යපුත්තික = (සක්‍යපුත්‍රගේ පුතු)**
**භාතුස්ස අපච්චං = භාතු + බ = භාතුබ්බ = (සොහොයුරාගේ පුතු)**

v. ණව - උපගු ආදී ශබ්දවලින් පර ව ණව ප්‍රත්‍යය වේ. **(ණවොපගවාදිහි)**

**උපගුනො අපච්චං = උපගු + ණව = ඔපගව = (උපගුගේ පුතු)**
**මනුනො අපච්චං = මනු + ණව = මානව = (මනුගේ පුතු)**

ණෙර - විධවා ආදී ශබ්දවලින් පරව ණෙර ප්‍රත්‍යය වේ. **(ණෙර විධවාදිතො)**

**විධවාය අපච්චං = විධවා + ණෙර = වෙධවෙර = (විධවාගේ පුතු)**
**සමණස්ස අපච්චං = සමණ + ණෙර = සාමණෙර = (ශ්‍රමණයාගේ පුතු)**

## අනෙකාර්ථ තද්ධිත නාම

ඇතැම් ප්‍රත්‍යයක බොහෝ අර්ථ ඇත. ඒවා අනේකාර්ථ ප්‍රත්‍යය නම්. අනේකාර්ථ ප්‍රත්‍යයවලින් අනේකාර්ථ තද්ධිත නාම සෑදේ.

**සත + ණික - සාතික - (ගිතෙලින් තැනූ)**
**සකට + ණික - සාකටික - (ගැලෙන් යන)**

## ප්‍රත්‍ය මාලාව

i. **ණික (යෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො) (තමධිතෙ තෙනකතාදිසන්නිධාන නියොග සිප්ප භාණ්ඩ ජීවිකත්‍ථෙසුච)**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (අ) තෙන සංසට්ඨො | - | සත | + ණික | - | සාතික | - | (ගිතෙලින් යුතු) |
| (ආ) තෙන තරති | - | උළුම්ප | + ණික | - | ඔළුම්පික | - | (පාරුවෙන් එතෙරවන්නා) |
| (ඉ) තෙන චරති | - | සකට | + ණික | - | සාකටික | - | (ගැල්පදවන්නා) |
| (ඊ) තෙන වහති | - | සීස | + ණික | - | සීසික | - | (හිසින් ගෙනයන්නා) |
| (උ) තං අධීතෙ | - | අභිධම්ම | + ණික | - | ආභිධම්මික | - | (අභිධර්මය උගත්තා) |
| (ඌ) තෙන කතං | - | වචසා | + ණික | - | වාචසික | - | (වචනයෙන් කරන ලද) |
| (එ) තස්මිං සන්නිධානං | - | සරීර | + ණික | - | සාරීරික | - | (ශරීරයේ හටගත්) |
| (ඔ) තස්මිං නියුත්තං | - | ද්වාර | + ණික | - | දොවාරික | - | (දොරටුවෙහි නියුක්ත) |
| (ක) අස්ස සිප්පං | - | විණා | + ණික | - | වෙණික | - | (වීණා ශිල්ප දත්) |
| (කා) අස්සභණ්ඩං | - | තණ්ඩුල | + ණික | - | තණ්ඩුලික | - | (සහල් විකුණන) |

ii. එය්‍යක, ණක

එහි වසයි එහි උපනි ආදී අර්ථවල **'ඉත්ථිලිඞ්ග'** නාමවලින් පරව යෙදේ. **(ඉත්ථිලිඞ්ගතො එය්‍යකො ණකො ච)**

චම්පා + එය්‍යක - චම්පෙය්‍යක - (චම්පාවෙහි වසන්නා වූ)
කුසිනාරා + ණක - කොසිණාරක - (කුසිනාරාවෙහි වසන්නා වූ)

iii. ආජානීය්‍ය - ඒ ජාතියෙහි විශිෂ්ට යන අර්ථය දේ.

අස්ස+ආජානීය්‍ය - අස්සාජානිය්‍ය - (විශිෂට අශ්වයා)

iv. ණ - එයින් පැහැගැන්විණි ආදී අර්ථවල යෙදේ.
**(ණ රාගා තෙන රත්තං තස්සෙදමඤ්ඤත්ථෙසු ච)**

(අ) තෙන රත්තං - හලිද්ද +ණ - හාලිද්ද = (කහපැහැ ගැන්වූ)
(ආ) තත්ථ ජාතං - මගධ+ණ - මාගධ = (මගධයෙහි උපන්)

v. ඉම, ඉය, කිය - ජාති ආදී ශබ්දවලට පරව යෙදේ. **(ජාතාදීන මිමියා ච- ජාතාදිසු ඉමො ඉයො ච හොති ච සද්දෙන කියො ච)**

| | | | |
|---|---|---|---|
| පච්ඡාජාතො | - පච්ඡිමො | - | (පසුව උපන් තැනැත්තා) |
| මනුස්සජාතියා ජාතො | - මනුස්සජාතියො | - | (මිනිස් ජාතියෙහි උපන් තැනැත්තා) |
| අන්ධකෙ ජාතො | - අන්ධකියො | - | (අන්ධක රටෙහි උපන් තැනැත්තා) |

vi. එයට සුදුසු එයට අයත් යන අර්ථවල ණෙය්‍ය ප්‍රත්‍යය යෙදේ.

වන + ණෙය්‍ය > වානෙය්‍ය = වනයේ හටගත්
දක්ඛිණා + ණෙය්‍ය > දක්ඛිණෙය්‍ය = දක්ෂිණාවට සුදුසු


නොමිලේ බෙදා හැරීම පිණිසයි

**අභ්‍යාස**

1. පහත වාක්‍ය සිංහලට නගන්න.

i. අථ ඛො වච්ඡායනො මානවො යෙන භගවා තෙනුපසංකමි.
ii. අභිධම්මිකො ආචරියො ආරඤ්ඤකානං භික්ඛූනං සන්දිට්ඨිකං ධම්මං කථෙසි.
iii. දොවාරිකො භණ්ඩාගාරිකං ඝාතෙත්වා රඤ්ඤො ධනං චොරෙසි.
iv. ලංකායං සුත්තන්තිකා ච වෙනයිකා ච ආභිධම්මිකා ච මාතුලගාමෙ ආලොකගුහං සන්නිපතිත්වා භගවතො ධම්මං පොත්ථකෙසු ලිඛිංසු.
v. භාණ්ඩාගාරිකස්ස භාගිණෙය්‍යො රාජකොට්ඨාගාරා බහුං ධනං ගහෙත්වා අත්තනො අත්ථාය යොජෙසි.

2. පාලියට නගන්න. (සුදුසු තන්හි තද්ධිත පද යොදන්න)

i. භාරද්වාජගේ පුත්‍රයා කච්චායන තෙරුන්ගේ බෑණා වීය.
ii. අතීතයෙහි මාර්ගවල බොහෝ කරත්තකරුවෝ ද පදිකයෝ ද වූහ.
iii. තෙරුන් වහන්සේලාගේ පේළියෙහි අන්තයෙහි සිටින සාමණේර හිමි අභිධර්මය උගත් කෙනෙක් වෙයි.
iv. ඡබ්බග්ගිය භික්ෂූහු ශාක්‍යපුත්‍රක භික්ෂූන්ට නුසුදුසු (අනුච්ඡවික) කටයුතු රාශියක් කළහ.
v. නගරවැසියන්ගේ දරුවෝ රනින් කරන ලද හෝ රිදියෙන් කරන ලද මල්මාලා පළඳිති.

3. පහත අදහස එන තද්ධිත පදය සුදුසු ප්‍රත්‍යය උපයෝගීකර ගෙන සකස් කරන්න.

i. විධවා (වැන්දඹුවගේ පුතු)
ii. කුසිනාරා (කුසිනාරාවෙහි උපන්)
iii. දක්ඛිණා (දක්ෂිණාවට සුදුසු)
iv. වන (වනයෙහි හටගත්)
v. වීණා (වීණාශිල්ප දන්නා)
vi. සංඝ (සංඝයාට අයත්)
vii. පරදාර (පරඹුවන් සේවනය කරන්නා)
viii. අන්ත (කෙළවර සිටින)
ix. ලොක (ලෝකයට අයත්)
x. සූකර (ඌරන් මරන්නා)

4. පහත 'අ' කොටසේ විග්‍රහයට අදාළ තද්ධිත පදය 'ආ' කොටසින් තෝරා ප්‍රකෘති ප්‍රත්‍යය වෙන්කර ලියන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| වසුදෙවස්ස පුත්තො | ආදිච්චො |
| රොහිණියා පුත්තො | ගාමතා |
| අදිතියා පුත්තො | ඵඤ්ඤං |
| නාවාය තරතීති | පඤ්චවග්ගියා |
| ධම්මෙ පසන්නො | රොහිණෙය්‍යො |
| නිරයෙ ජාතො | නෙරයිකො |
| පච්ඡා ජාතො | පච්ඡිමො |
| පඤ්චවග්ගෙභවා | නාවිකා |
| ඵනතො ජාතං | වාසුදෙවො |
| ගාමානං සමූහො | ධම්මිකො |

5. දී ඇති තද්ධිත පද යෝග්‍ය පරිදි යොදා පහත ඡේදය පාලියට නගන්න.

**ගෞතම ගෝත්‍රයේ උපන් ශාක්‍යපුත්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ** එක්තරා කාලයක කුසිනාරාවට ගොස් **කුසිනාරා වැසියන්ට තමා විසින් දතයුතු වූ** ධර්මය දේශනා කළ සේක. **කුසිනාරාවෙහි වසන තෙල් වෙළෙන්දෝ සහල් වෙළෙන්දෝ** ගැල්පදවන්නෝ **පයින් යන්නෝ දොරටුපාලවරු භාණ්ඩාගාරිකවරු** ආදී බොහෝ මිනිස්සු ධර්මය ඇසූහ. බණ අසා **ධර්මයෙහි පැහැදුණාහු** උදෑසන **පිණ්ඩපාතික භික්ෂූන්ට** දන් පිරිනැමූහ. සමහරු ධනය යොදවා ආරාම කොට **සංඝයාට අයත්කොට** පූජා කළහ. සමහරු පැවිදි වූහ. පැවිදි වී **සූත්‍රාන්ත උගත්තෝ** විනය **උගත්තෝ අභිධර්මය උගත්තෝ** වූහ. ඇතැම් **භික්ෂූහු ආරණ්‍යක වූ වෘක්ෂමූලික වූවෝ** බවුන් වඩා **රහත්බව** ලැබූහ.

| | | |
|---|---|---|
| අරහත්තං | පිණ්ඩපාතිකානං | දොවාරිකා |
| ආරඤ්ඤකා | සුත්තන්තිකා | ධම්මිකා |
| සක්‍යපුත්තිකො | ආභිධම්මිකා, | සන්දිට්ඨිකං |
| තණ්ඩුලිකා | ගොතමො | සංඝිකං |
| පදිකා | රුක්ඛමූලිකා | වෙනයිකා |
| භාණ්ඩාගාරිකා | භගවා | තෙලික |
| කොසිනාරකා | සාකටිකා | කොසිනාරකානං |